# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ
***

## පුවත්පත් නිවේදනය

**<u>මහත්මා ගාන්ධිතුමාගේ 150 වන ජන්ම සංවත්සරය සැමරීම සඳහා නුවරඑළිය, ඩන්සිනන් වතුයායේ මහත්මා ගාන්ධි පුරම හි පැළ 1600 ක් රෝපණය කෙරේ</u>**

මහත්මා ගාන්ධිතුමාගේ 150 වන ජන්ම සංවත්සරය, ලෝක පරිසර දිනය සහ ජාත්‍යන්තර යෝගා දිනය සැමරීම සඳහා විශේෂ පැළ සිටුවීමේ උත්සවයක් 2019 ජුනි 20 වන දින නුවරඑළිය, ඩන්සිනන් වතුයායේ මහත්මා ගාන්ධි පුරම් හිදී සංවිධානය කර තිබිණ.

"ලෝකය සෑම මිනිසෙකුගේම අවශ්‍යතාවයන්ට ප්‍රමාණවත් නමුත් සෑම මිනිසෙකුගේම කෑදරකමට ප්‍රමාණවත් නොවේ " යන්න මහත්මා ගාන්ධිතුමාගේ ප්‍රකට කියමනකි . එතුමා ස්වභාව ධර්මයට අනුකූලව ජීවත්වීම සැමරීම සඳහා මෙම පැළ රෝපණය කරන ලදී. ස්වාභාවික පරිසරය පමණ ඉක්මවා භාවිතා කිරීම කෙරෙහි ලොව පුරා අවධානය යොමු වී ඇති අතර මෙවර යෝගා දිනයද සමරන ලද්දේ "දේශගුණික විපර්යාස වැළක්වීම සඳහා ක්‍රියාකාරී වෙමු" යන තේමාව යටතේය.

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය එක්ව සංවිධානය කළ මෙම අවස්ථාවේදී පැළ 1600 ක් මහත්මා ගාන්ධි තුමාගේ නමින් නම් කරන ලද ගම්මානයේ රෝපණය කරන ලදී. ඉන්දියානු මූල්‍ය ආධාර යටතේ ඉදිකරන ලද එම ගම්මානය පසුගිය වසරේදී ජනතා අයිතියට පත් කරන ලදී.

ශ්‍රී ලංකා යුධ හමුදාපති ලුතිනන් ජෙනරාල් මහේෂ් සේනානායක මැතිතුමා, වැවිලි මානව සංවර්ධන භාරයේ (PHDT) සභාපති වී. පුත්තිරසිගමනි මැතිතුමා හා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංවර්ධන සහයෝගීතා උපදේශක ඩී. සී. මංජුනාත් මැතිතුමා මෙම පැළ ජනතාව

වෙත ලබාදුන් අතර සංකේතාත්මකව පැළ සිටුවීමද සිදු කළෝය . පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ මධ්‍යම පළාත් සභාවේ සාමාජිකයින් රැසක්, රජයේ නිලධාරීන්, වැවිලි මානව සංවර්ධන භාරයේ නිලධාරීන් (PHDT), UN Habitat ආයතනයේ නිලධාරීන්, ඇල්පිටිය ප්‍රාදේශීය වැවිලි සමාගමේ නිලධාරීන්, අනෙකුත් පාර්ශවකරුවන් සහ ප්‍රදේශවාසීන් විශාල පිරිසක්ද මෙම උත්සවයට සහභාගී වූහ.

*****

කොළඹ
2019 ජූනි 20